## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## මධ්‍ය වාර පරීක්ෂණය - 2014
## බුද්ධ ධර්මය – I පත්‍රය
## 8 ශ්‍රේණිය

කාලය මිනිත්තු 30යි.

නම / විභාග අංකය :- ..........................................................................................

---

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න

01. බුදුදහමට අනුව නොදුන් දේ ගැනීම, මංකොල්ල කෑම, පැහැර ගැනීම අකුසලයකැයි පාපයකැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. ජීවත්වීමේ අයිතිය මෙන්ම දේපළ අයිතියද සුරැකිය යුතුයි. මෙම ප්‍රකාශයට අනුව අප විසින් සුරැකිය යුතු ශික්ෂා පදය වන්නේ,
(i) මුසාවාදයෙන් වැළකීමයි (ii) ප්‍රාණඝාතයෙන් වැළකීමයි
(iii) අදත්තාදානයෙන් වැළකීමයි (iv) කාම මිත්‍යාචාරයෙන් වැළකීමයි

02. යෝ වදතං පවරෝ මනු ජේසු මෙම ගාථාව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුවේ
(i) උපතිස්ස පිරිවැජියාටය (ii) මිගාර සිටුතුමාටය
(iii) ඡත්ත මානවකයාටය (iv) මඝ මානවකයාටය

03. සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වන පරිදි කල්‍යාණ මිත්‍රයෙකු නොවන්නේ
(i) සමාන සුඛ දුක්ඛ මිතුරාය (ii) අනුකම්පක මිතුරාය
(iii) උපකාරක මිතුරාය (iv) වචීපරම මිතුරාය

04. බෞද්ධ නිවසක කෙනෙකු මියගිය විට ස්වාමීන් වහන්සේලා වැඩමවා සිදු කරන චාරිත්‍ර වලින් වැදගත්ම ආගමික චාරිත්‍රය වන්නේ
(i) මතක වස්ත්‍ර, දැහැත්, ගිලන්පස පූජා කර පැන් වැඩීමයි
(ii)ගුණ කථනයක් ඉදිරිපත් කිරීමයි
(iii) ඥාතීන් සමඟ දුක බෙදා ගැනීමයි
(iv) ආගමික වතාවත් වලින් පසු මළගෙදරට ගොස් ආහාර අනුභව කිරීමයි

05. ගැබිනි මවුවරුන්ට ආශිර්වාද කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා විසින් සජ්ඣායනා කරනු ලබන්නේ
(i) රතන සූත්‍රයයි (ii) අංගුලිමාල පිරිතයි
(iii) කරණීය මෙත්ත සූත්‍රයයි (iv) මහා මංගල සූත්‍රයයි

06. "පරිසරය අපවිත්‍ර වන සේ ඉඳුල් වතුර සෑම තැනකම නොදැමිය යුතුයි." යනුවෙන් උපදෙස් දෙන්නේ
(i) සේඛියා දහම් වලය (ii) ධම්මපදයේය
(iii) පිරිත් පොතේය (iv) පන්සිය පනස් ජාතක පොතේය

07. සිව්වණක් පිරිසට අයත් නොවන්නේ
(i) භික්ෂු (ii) භික්ෂුනී (iii) දේව (iv) උපාසිකා

08. තෘෂ්ණාවේ ප්‍රභේද ගණන
(i) දෙකකි (ii)තුනකි (iii) හතරකි (iv) පහකි

09. මේවා අතරින් ආනන්තරිය පාපකර්ම වලට අයත් වන්නේ කුමක්ද?
(i) බොරුකීම (ii) කේලාම් කීම
(iii) බුදුරදුන්ගේ ඇඟේ ලේ සෙලවීම (iv) සත්ව ඝාතනය

10. තමාටත් වඩා තමා ආදරය කරන වෙනත් කිසිවෙකු නැතැයි පැවසූවේ
(i) අනුලා බිසව
(ii) බිම්බිසාර රජු
(iii) මල්ලිකා බිසව
(iv) සුද්ධෝදන රජු

11. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්
(i) හය මසකට පසුවය
(ii) දෙ මසකට පසුවය
(iii) පස් මසකට පසුවය
(iv) තෙ මසකට පසුවය

12. "පියෙහි විප්පයෝග " යනුවෙන් අදහස් කරන්නේ
(i) ප්‍රියයන් ගෙන් වෙන්වීමයි
(ii) කැමති දේ නොලැබීමයි
(iii) අප්‍රියයන් ගෙන් වෙන්වීමයි
(iv) සසර දුකයි

13. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායකයා වූයේ
(i) සැරියුත් තෙරණුවෝ
(ii) මුගලන් තෙරණුවෝ
(iii) ආනන්ද තෙරණුවෝ
(iv) මහාකාශ්‍යප තෙරණුවෝ

14. ඉච්ඡිත අලාභ දුක්ඛය යන්නෙන් අදහස් කරන්නේ
(i) හිතේ වෙහෙසකර ගතියයි
(ii) කැමති දේ නොලැබීමේ දුකයි
(iii) බෝග වලට විපත් පැමිණීමයි
(iv) ප්‍රියජනක පරිසරයකින් වෙන් වන විට ඇති වන දුකයි

15. බුදුරජාණන් වහන්සේ ලොව තතු ඇති සැටියෙන් මැනවින් දැක වදාළ සේක. එබැවින් බුදුරදුන්
(i) සම්මා සම්බුද්ධ නම් වන සේක
(ii) ලෝක විදූ නම් වන සේක
(iii) අරහං නම් වන සේක
(iv භගවා නම් වන සේක

16. තෙරුවන් ගුණ පිළිවෙලින් අඩංගු පිළිතුර වනුයේ
(i) 6, 6, 9
(ii) 9, 6, 9
(iii) 9, 9, 6
(iv) 6, 9, 6

17. බෞද්ධ සංඝ සමාජයේ ආචාරශීලීත්වය හා ප්‍රසන්න බව ඇති කර ගැනීමට අදාළ ශික්ෂණ විධි සමූහය හඳුන්වන්නේ
(i) සුපිළිසන් වීම ලෙසයි
(ii) සේඛියා දහම් ලෙසයි
(iii) අභිධර්මය ලෙසයි
(iv) සාරධර්ම ලෙසයි

18. දිවා රෑ පිං වැඩෙනා උතුම් ක්‍රියාවක් ලෙසස බුදුදහමේ දැක්වෙන්නේ
(i) ස්වභාවික කෙත්වතු, කැලෑ වැවීම හා රැකීමයි
(ii) දිවා රෑ සිල් රැකීමයි
(iii) කුණුකසල මහමඟ දමා යාමයි
(iv) ඒ දඬු, පාලම් කඩා ඉවත් කිරීමයි

19. ඇඟිලි බැඳ දොහොත් මුදුන් දී නමස්කාර කිරීමට සුදුසු නිසා මහා සංඝරත්නය
(i) ආහුණෙය්‍යය නම් වේ
(ii) සුපටිපන්න නම් වේ
(iii) ඤාය පටිපන්න නම් වේ
(iv අඤ්ජලිකරණීය නම් වේ

20. කෑමට අත දමමින් නොම ගන්නේ .......... මෙම කවිය ඇතුලත් කාව්‍ය ග්‍රන්ථය වන්නේ
(i) ලෝවැඩ සඟරාවයි
(ii) සිරිත් මල්දමයි
(iii) කාව්‍ය ශේඛරයයි
(iv) වදන් කවි පොතයි

( ලකුණු 2 x 20 = 40 )

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
මධ්‍ය වාර පරීක්ෂණය - 2014
බුද්ධ ධර්මය – II පත්‍රය
8 ශ්‍රේණිය

කාලය පැය 01 මිනිත්තු 30 යි.

නම / විභාග අංකය :- ....................................................................................

---

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

01. "සොබා සිරි විඳිමු. තුරුලතා රකිමු." පාඩම යටතේ ඔබ කණ්ඩායම විසින් සකසන ලද පරිසර හිතකාමී වීමේ වැදගත්කම දැක්වෙන බිත්ති පුවත්පත ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

i. එම බිත්ති පුවත්පතට ඔබ යෙදූ නම කුමක්ද? ( ලකුණු 02 )
ii. බිත්ති පුවත්පත සෑදීමට උපයෝගී කරගත් ද්‍රව්‍ය දෙකක් ලියන්න ( ලකුණු 02 )
iii. ඔබට ඒ සඳහා උපදෙස් ලබා දුන් පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න ( ලකුණු 02 )
iv. ඔබ එහි ඇතුලත් කළ පරිසරය විනාශ වන ක්‍රම දෙකක් ලියන්න ( ලකුණු 02 )
v. එහි ඇතුලත් කළ පරිසරය සුරැකීමට කළයුතු කාර්යයන් දෙකක් ලියන්න ( ලකුණු 02 )
vi. බිත්ති පුවත්පතේ ඇතුලත් වූ අංග දෙකක් ලියන්න ( ලකුණු 02 )
vii. කණ්ඩායමක් ලෙස වැඩ කිරීමෙන් ඔබ ලද ප්‍රයෝජන දෙකක් ලියන්න ( ලකුණු 02 )
viii. බිත්ති පුවත්පත සැකසීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න ( ලකුණු 02 )

02.
i. චතුරාර්ය සත්‍ය පිළිවෙලින් නම් කරන්න ( ලකුණු 02 )
ii. ඉන් පළමු ආර්ය සත්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න ( ලකුණු 03 )
iii. ඔබේ ජීවිතයේ දුක ඇති වූ අවස්ථා තුනක් දක්වමින් ඒවාට ඔබ ගත් විසඳුම්ද ඉදිරිපත් කරමින් පේළි හයක පමණ කෙටි රචනයක් ලියන්න ( ලකුණු 06 )

03.
i. පන්සිල් වලින් මුල් ශික්ෂා පද දෙක ලියන්න ( ලකුණු 02 )
ii. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න ( ලකුණු 03 )
iii. සාමකාමී පරිසරයක් ගොඩනැගීමෙහිලා පන්සිල් වලින් ලැබෙන පිටුවහල උදාහරණ දෙමින් විස්තර කරන්න ( ලකුණු 06 )

04.
i. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වන පරිදි කල්‍යාණ මිත්‍රයින් සිව් දෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න ( ලකුණු 02 )
ii. ඔවුන්ගෙන් එක් අයෙකුගේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න ( ලකුණු 03 )
iii. "කල්‍යාණ මිත්‍ර සේවනය සමාජයේ පැසසුමට හේතු වේ." මෙය පැහැදිලි කරන්න ( ලකුණු 06 )

05.
i. සාරංච සාරතෝ ඤත්වා .......... යන ධම්මපද ගාථාව ලියන්න ( ලකුණු 02 )
ii. එහි අර්ථය ලියන්න ( ලකුණු 04 )
iii. "අපේ ජීවිත සාර්ථක කර ගැනීමට නම් අප නිවැරදි කල්පනාවෙන් යුක්ත විය යුතුය." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න ( ලකුණු 05 )

06.

i. ජීවිත අභියෝග ජය ගැනීම සඳහා බුද්ධ චරිතයෙන් ආදර්ශ ගත හැකි සිද්ධි දෙකක් නම් කරන්න ( ලකුණු 02 )

ii. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න ( ලකුණු 03 )

iii. ශිෂ්‍ය ජීවිතයේදී අභියෝග ජයගෙන ජීවිතය සරු කර ගැනීමට ඔබට කළ හැකි දේ ගැන විස්තරයක් කරන්න ( ලකුණු 06 )

07.

ඔබ විසින් නිර්මාණය කරන ලද සංඛ්‍යා ධර්ම කෝෂයේ

i. සංඛ්‍යා තුනක් ඇතුලත් ධර්ම කරුණු දෙකක් නම් කරන්න ( ලකුණු 02 )

ii. සංඛ්‍යා හතරක් ඇතුලත් ධර්ම කරුණු තුනක් නම් කරන්න ( ලකුණු 03 )

iii. සංඛ්‍යා ධර්ම කෝෂය සකස් කිරීමෙන් ඔබට ලද හැකි ප්‍රයෝජන මොනවාදැයි විස්තර කරන්න ( ලකුණු 06 )

The National e-learning Portal for The General Education